# විෂයමාලා ආවරණය සඳහා යෝජිත වැඩසටහන

## දෙවන ශ්‍රේණිය (දෙවන වාරය)

**2022**

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# යෝජිත වැඩසටහන සඳහා උපදෙස් මාලාව

2022 පාසල් වර්ෂය සඳහා පාසල්වල දෛනික පරිපාලන කටයුතු හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය බාධාවකින් තොරව සාමාන්‍ය පරිදි පවත්වා ගැනීම උදෙසා කඩිනම් පියවර ගැනීමට සිදු වී තිබේ.

ඒ අනුව මෙම අධ්‍යයන වර්ෂය තුළ දී අනිවාර්යයෙන් ම අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත හඳුනා ගෙන ඊට අනුව කාලය වෙන් කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම මෙමගින් අපේක්ෂිත ය.

ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපන අවධියේ එක් එක් ශ්‍රේණිවල දෙවන වාරයට නිර්දිෂ්ට ඉගෙනුම් අන්තර්ගතවලින් අත්‍යවශ්‍ය ඉගෙනුම් කොටස් පමණක් මෙමගින් ඉදිරිපත් කරනු ලබයි. මෙම විෂය කොටස් සාධනය වූ විට දෙවන වාරයට අවශ්‍ය ඉගෙනුම් අවස්ථා සඳහා සුදුසුකම් ලබන බව වැඩිදුරටත් සඳහන් කරමු.

එමෙන් ම දැනටමත් දෙවන වාරයට අදාළ යම් පමණක විෂය කොටස් ප්‍රමාණයක් ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව විවිධතාවලින් යුතු ව පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වී ඇත. එසේ වුවද අප විසින් යෝජනා කරනු ලබන්නේ දෙවන වාරයට අදාළ ව සිසුන් විසින් අත්‍යවශ්‍යයෙන් ම අත්පත් කරගත යුතු විෂය කොටස් ය. මෙම යෝජිත විෂය කොටස්වලින් ද ඔබ පාසලේ ආවරණය වූ විවිධ විෂයය කොටස් තිබිය හැකි ය. එසේ වූ විට දී එම කොටස් අතහැර ඊළඟට ඇති විෂයය කොටසේ සිට පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමට අප විසින් යෝජනා කරන්නෙමු.

එමෙන් ම එක් එක් විෂය අන්තර්ගත සඳහා යෝජිත කාලය ඔබ පන්ති කාමරයේ සිටින සිසුන්ගේ සාධනය මත නම්‍යශීලී ව හා සාධාරණ ව වෙනස් කර ගැනීමට ඔබට නිදහස ඇත. එනමුත් යෝජිත විෂය අන්තර්ගතවලින් අඩු නොකොට ඒ සියල්ල මනා ලෙස සම්පූර්ණ කිරීමේ වගකීම ද ඔබ සතු ය.

එක් එක් විෂය සඳහා ගුරුමාර්ගෝපදේශයට අනුව දෙවන වාරයට නිර්දිෂ්ට විෂය අන්තර්ගත මාර්ගගත ක්‍රමයට හෝ ඉතාමත් සරල පැහැදිලි කිරීම්වලින් අනතුරු ව නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රියාකාරකම් ලෙසට හෝ ආවරණය කළ හැකි ය. එසේ වුවත් නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ලබා දෙන ක්‍රියාකාරකම් සිසුන්ට අනවශ්‍ය බරක්, පීඩනයක් නොවන ආකාරයට ලබා දීම ද ඔබ සතු වගකීමකි.

එමෙන් ම අප විසින් යෝජනා කරනු ලබන අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත ඒ ඒ විෂය තක්සේරුවට අනුව විධිමත් ලෙස තක්සේරු කිරීම ඔබ සතු වගකීමකි. මීට අමතර ව මාර්ගගත ක්‍රමයට සහ නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමයට ආවරණය කරනු ලබන විෂය කොටස්වලට අදාළ ව සිසුන් විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් නැවත පන්ති කාමරයට ගෙන්වා ගත යුතු ය. අනතුරු ව ඒවා සිසුන් ඉදිරියේ පරීක්ෂා කර අවශ්‍ය ප්‍රතිපෝෂණ සහ ඉදිරිපෝෂණ ලබා දී විෂය තක්සේරුවට අනුව තක්සේරු කිරීම ද සිදු කළ යුතු ය.

ඒ අනුව සෑම විෂයයක ම අදාළ වාරයට අපේක්ෂිත ඉගෙනුම් පල කරා සියලු ම සිසුන් ළඟා කරවීම ඔබ සතු වගකීමකි. කෙසේ වුවත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිසුන් සෞඛ්‍ය සම්පන්න ව, ආරක්ෂිත ව, ප්‍රීතිමත් ව සහ ක්‍රියාශීලී ව ඒ සඳහා යොමු කරලීමේ වගකීම ද ඔබ සතු ය. ඒ අනුව ශ්‍රී ලාංකේය ප්‍රාථමික අධ්‍යාපනය හදාරන සිසුන්ගේ ඉගෙනුම් කාර්යය ශක්තිමත් හා ඵලදායී කරලීමේ උතුම් අරමුණින් මේ සියල්ල ක්‍රියාත්මක කිරීමට ඔබට ශක්තිය ලැබේවා යි පතමු.

## මව්බස - සිංහල
## දෙවන ශ්‍රේණිය ( දෙවන වාරය)

දෙවන ශ්‍රේණියේ දෙවන වාරය සඳහා ආවරණය කළ යුතු අත්‍යවශ්‍ය විෂය අන්තර්ගත පහත පරිදි යෝජනා කෙරෙයි. ඒ අනුව දී ඇති අනුක්‍රමයට අදාළ ව ඉගෙනුම් පල සාධනයට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කළ යුතු ය.

දෙවන ශ්‍රේණියේ දෙවන වාරයට යෝජිත මෙහි සඳහන් විෂය අන්තර්ගතවලට අදාළ ක්‍රියාකාරකම් කිරීමට පෙර දෙවන ශ්‍රේණියේ පළමුවන වාරයට අදාළ අකුරු සහ පිලි භාවිතයේ නිරවද්‍යතාව, වචන අසා ලිවීම, වාක්‍ය ගොඩනැගීම සහ ශබ්දනගා කියවීම මැන බැලීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පැය කිහිපයක් වෙන් කර සිසුන්ගේ හැකියාව මැන බැලීමට සහ සිසුන්ගේ පෙර මතකය ආවර්ජනය කිරීමට ඔබ විසින් සකස් කරන ලද ක්‍රියාකාරකම් සිසුන්ට ලබා දිය යුතු ය. ඒ අනුව එක් එක් සිසුවාගේ සාධන මට්ටම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔබ විසින් ලබා ගත යුතු ය. ඉන් පසු ව දෙවන ශ්‍රේණියේ දෙවන වාරය සඳහා අප විසින් යෝජනා කරනු ලබන විෂය අන්තර්ගත සඳහා යොමු විය හැකි ය.

දෙවන ශ්‍රේණියේ දෙවන වාරය සඳහා යෝජිත විෂය අන්තර්ගත පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී සිදු කළ යුතු ය. පිලි සහිත අකුරු හතරේ වචනවලට අදාළ අභ්‍යාස ගුරුවරයා විසින් සකස් කර සිසුන්ට ලබා දිය යුතු ය. ඊට අමතර ව දෙවන වාරය සඳහා නිර්දිෂ්ට තුන්වන සහ හතරවන ඉගෙනුම් පලවලට අදාළ ක්‍රියාකාරකම් මාර්ගගත ක්‍රමය සහ නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ලබා දිය හැකි ය.

| දෙවන ශ්‍රේණිය - මව්බස (සිංහල) දෙවන වාරය | | | | | | |
|---|---|---|---|---|---|---|
| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මාර්ගෝපදේශ පිටු අංක | කාලය |
| අකුරු පැහැදිලි ව හා නිවැරදි ව සරල වැකියක් පිටපත් කරයි. | L1<br>අවබෝධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා සවන් දෙයි.<br><br>S1<br>අවබෝධයෙන් පැහැදිලි උච්චාරණය සහිත ව අර්ථය පැහැදිලි වන සේ කතා කරයි. | පවසන දෙයට අවබෝධයෙන් යුතු ව සවන් දී ක්‍රියා කරයි. | කතන්දරවලට සවන් දීම | ක්‍රියාකාරකම 03 | 12 | මි30 |
| | | | පින්තූර කතාවලට සවන් දීම | ක්‍රියාකාරකම 04 | 12 | මි30 |
| | | | නිදහසේ කතන්දර කීම | ක්‍රියාකාරකම 07 | 14 | මි30 |
| | | | පින්තූර කතාවලින් කියවෙන දේ පිළිබඳ කතා කිරීම | ක්‍රියාකාරකම 08 | 15 | මි30 |

**දෙවන ශ්‍රේණිය - මව්බස (සිංහල) දෙවන වාරය**

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මාර්ගෝපදේශ පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| අකුරු පැහැදිලි ව හා නිවැරදි ව සරල වැකියක් පිටපත් කරයි. | R1<br>කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි.<br><br>W1<br>සම්මත නිවැරදි ක්‍රමයට ලියයි | ▪ අකුරු එකතු කර වචන සාදා වැකි ලියයි.<br><br>▪ ප්‍රශ්නාර්ථ ලකුණ නිවැරදි අර්ථ ගැන්වීමක් සඳහා වැකිවල යොදයි<br><br>▪ නිවැරදි අර්ථ ගැන්වීමක් සඳහා කොමාව උචිත පරිදි භාවිත කරයි | ▪ පිලි සහිත වචන එකතු කර වාක්‍යාංශ සහ වැකි කියවීම සහ ලිවීම. | සරල වැකි කියවීම සහ ලිවීම | 41,42 | පැය03 |
| | | | ▪ නැවතීමේ ලකුණට අනුගත ව කියවීම හා නැවතීමේ ලකුණ යොදා ලිවීම (මේ සඳහා දෙවන ශ්‍රේණියේ කියවීම් පොතේ පාඩම් යොදා ගන්න.) | නැවතීමේ ලකුණ | 42 | පැය05 |
| | | | ▪ ප්‍රශ්නාර්ථ ලකුණට අනුගත ව කියවීම හා ප්‍රශ්නාර්ථ ලකුණ යොදා ලිවීම (මේ සඳහා දෙවන ශ්‍රේණියේ කියවීම් පොතේ පාඩම් යොදා ගන්න.) | ප්‍රශ්නාර්ථ ලකුණ | 42 | පැය04 |
| | | | ▪ කොමාවට අනුගත ව කියවීම හා කොමාව යොදා ලිවීම (මේ සඳහා දෙවන ශ්‍රේණියේ කියවීම් පොතේ පාඩම් යොදා ගන්න.) | කොමාව | 42 | පැය03 |

| දෙවන ශ්‍රේණිය - මව්බස (සිංහල) දෙවන වාරය | | | | | | |
|---|---|---|---|---|---|---|
| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මාර්ගෝපදේශ පිටු අංක | කාලය |
| | L2<br>සවන් දීමේ කුසලතා සංවර්ධනය සඳහා සවන් දෙයි<br><br>S2<br>කථන කුසලතා සංවර්ධනය සඳහා කතා කරයි<br><br>R2<br>කියවීමේ කුසලතා සංවර්ධනය සඳහා කියවයි<br><br>W2<br>ලිවීමේ කුසලතා සංවර්ධනය සඳහා ලියයි | ▪ වචනවල ශබ්දමය වෙනස්කම් හඳුනා ගෙන භාවිත කරයි<br><br>▪ නිවැරදි ලෙස අකුරු එකතු කර අකුරු කියවයි<br><br>▪ වචනයක ඇති ශබ්ද හඳුනා ගෙන ලියා දක්වයි | ▪ පිලි රහිත අකුරු දෙකේ වචන | ක්‍රියාකාරකම 01 | 43 | පැය.02 |
| | | | ▪ පිලි රහිත අකුරු තුනේ වචන | ක්‍රියාකාරකම 02 | 44 | පැය.02 |
| | | | ▪ පිලි රහිත අකුරු හතරේ වචන | ක්‍රියාකාරකම 03 | 45 | පැය.02 |
| | | | ▪ පිලි සහිත අකුරු දෙකේ වචන | ක්‍රියාකාරකම 04 | 46, 47 | පැය.03 |
| | | | ▪ පිලි සහිත අකුරු තුනේ වචන | ක්‍රියාකාරකම 05 | 47, 48 | පැය.03 |
| | | | ▪ පිලි සහිත අකුරු හතරේ වචන | සකස් කරන ලද ක්‍රියාකාරකම | | පැය.03 |

| දෙවන ශ්‍රේණිය - මව්බස (සිංහල) දෙවන වාරය | | | | | | |
|---|---|---|---|---|---|---|
| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මාර්ගෝපදේශ පිටු අංක | කාලය |
| | L4<br>එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සවන් දෙයි | ■ ලබා දෙන උපදෙස් අවබෝධ කර ගෙන ඒ අනුව ක්‍රියා කරයි | ■ උපදෙස් | ක්‍රියාකාරකම 01 | 55 | පැය.01 |
| | S4<br>එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කතා කරයි | ■ තොරතුරු අවබෝධ කර ගෙන ඒ අනුව ක්‍රියා කරයි | ■ තොරතුරු | ක්‍රියාකාරකම 02 | 55, 56 | පැය.01 |
| | R4<br>එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කියවයි<br>W4<br>එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ලියයි | ■ තමා පිළිබඳ තොරතුරු පැහැදිලි ව ඉදිරිපත් කරයි | ■ තමා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | ක්‍රියාකාරකම 03 | 56 | පැය.01 |
| | | | | | මුළු කාලය | පැය35 |

## ගණිතය
## දෙවන ශ්‍රේණිය (දෙවන වාරය)

ගණිතය විෂයමාලාවේ දෙවන ශ්‍රේණියේ දෙවන වාරයට අදාළ අත්‍යවශ්‍ය ම ඉගෙනුම් සංකල්ප සාධනය සඳහා අවශ්‍ය විෂය අන්තර්ගතය වෙන වෙන ම මෙහි ඇතුළත් කර ඇත. සිසුන් පීඩනයට පත් නොවන අයුරින් ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා මෙය උදවු කර ගන්න. මෙහි යෝජනා කර ඇති කාලය උචිත පරිදි ගළපා ගනිමින් ගුරු මාර්ගෝපදේශයේ දක්වා ඇති මගපෙන්වීම් ද ප්‍රයෝජනයට ගෙන ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.

දෙවන ශ්‍රේණියේ දෙවන වාරයට යෝජිත මෙහි සඳහන් විෂය අන්තර්ගතවලට අදාළ ක්‍රියාකාරකම් කිරීමට පෙර පළමුවන වාරයේ දී ගණිතය විෂය සඳහා අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය විෂය කොටස් සිසුන් තුළ සාධනය වී ඇද්දැයි පරීක්ෂා කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පැය කිහිපයක් වෙන් කර සිසුන්ගේ හැකියාව මැන බැලීමට සහ සිසුන්ගේ පෙර මතකය ආවර්ජනය කිරීමට ඔබ විසින් සකස් කරන ලද ක්‍රියාකාරකම් සිසුන්ට ලබා දිය යුතු ය. ඒ අනුව එක් එක් සිසුන්ගේ සාධන මට්ටම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔබ විසින් ලබා ගත යුතු ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා අත්කරගෙන ඇති ද යන්න තහවුරු කරගන්න. ක්‍රියාකාරකම්වලට උචිත අයුරින් ගණිතය වැඩ පොතේ අභ්‍යාස සඳහා ද සිසුන් යොමු කරන්න.

සමහර නිපුණතාවලට අදාළ ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ සිදු කිරීමෙන් පසු ව එම සංකල්ප තව දුරටත් තහවුරු කිරීම සඳහා නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ද අභ්‍යාස සඳහා සිසුන් යොමු කළ හැකි ය.

## දෙවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| ද්‍රව්‍ය ගොඩක් ගණන් කර අගය ඉලක්කමෙන් පැහැදිලි ව ලියයි. | ■ එක ම වර්ගයේ ද්‍රව්‍ය/රූප 50ක් ගණන් කරයි. | ■ ද්‍රව්‍ය/රූප 20ක් ගණන් කරයි.<br>■ 1 සිට 50 තෙක් සංඛ්‍යා නාම අනුපිළිවෙළින් කියයි.<br>■ එක ම වර්ගයේ ද්‍රව්‍ය 50ක් ගණන් කරයි.<br>■ එක ම වර්ගයේ රූප 50ක් ගණන් කරයි. | ■ ද්‍රව්‍ය සහ රූප 50කට නොවැඩි සංඛ්‍යාවක් ගණන් කිරීම | පාඩම 12 ක්‍රියාකාරකම 1 සිට 4 | 35 සිට 37 | පැය 2 |
| | ■ ඉලක්කම් දෙකේ සංඛ්‍යාවක එක් එක් ඉලක්කමේ ස්ථානීය අගය දක්වයි. | ■ 20 තෙක් සංඛ්‍යාවක ඇති දහයේ ඒවා සහ එකේ ඒවා ප්‍රකාශ කරයි.<br>■ 10 සිට 20 තෙක් සංඛ්‍යාවක එකේ ඒවා සහ දහයේ ඒවා ද්‍රව්‍ය මගින් නිරූපණය කරයි.<br>■ 10 සිට 20 තෙක් සංඛ්‍යාවක එකේ ඒවා සහ දහයේ ඒවා නිවැරදි ව හඳුනා ගනිමින් සංඛ්‍යාංක ලියා දක්වයි. | ■ ස්ථානීය අගය හඳුනා ගැනීම<br>■ ද්‍රව්‍ය මගින් නිරූපණය<br>■ සංඛ්‍යාංක මගින් දැක්වීම | පාඩම 13 ක්‍රියාකාරකම 1 සිට 4 | 38 සිට 42 | පැය 2 |

දෙවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| තනි ඉලක්කමේ සංඛ්‍යා දෙකක එකතුව ලියා දක්වයි. | ■ එකතුව 20 තෙක් වන සංඛ්‍යා එකතු කරයි. | ■ එකතුව 20 ට නොවැඩි වන සංඛ්‍යා දෙකක් එකතු කරයි.<br>■ සංඛ්‍යා දෙකක එකතුව 20ට නොවැඩි වන සේ සරල ගැටලු විසඳයි.<br>■ එකතුව 20 ට නොවැඩි වන සේ එකතු කිරීමේ සංඛ්‍යා බන්ධන සහිත ගැටලු විසඳයි. | ■ 20 තෙක් එකතු කිරීම<br>■ 20 තෙක් එකතු කිරීමේ ගැටලු විසඳීම | පාඩම 14 ක්‍රියාකාරකම 1 සිට 4 | 43 සිට 46 | පැය 2 |
| නවයට නොවැඩි සංඛ්‍යාවකින් ඊට අඩු සංඛ්‍යාවක් අඩු කර පිළිතුර ලියා දක්වයි. | ■ 20 ට නොවැඩි සංඛ්‍යාවකින් එයට අඩු සංඛ්‍යාවක් අඩු කිරීමේ ගැටලු විසඳයි. | ■ 20 ට නොවැඩි සංඛ්‍යාවකින් එයට අඩු සංඛ්‍යාවක් අඩු කරයි.<br>■ 20 ට නොවැඩි සංඛ්‍යාවකින් එයට අඩු සංඛ්‍යාවක් අඩු කිරීමේ සරල ගැටලු විසඳයි. | ■ 20 තෙක් සංඛ්‍යා ඇසුරෙන් අඩු කිරීම සහ ගැටලු විසඳීම | පාඩම 15 ක්‍රියාකාරකම 1 සිට 4 | 47 සිට 50 | පැය 2 |

## දෙවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | ■ අභිමත ඒකක භාවිතයෙන් ද්‍රව ප්‍රමාණ මනියි; සසඳයි. | ■ අභිමත ඒකකයක් භාවිතයෙන් ද්‍රව ප්‍රමාණ දෙකක් මැන අඩු වැඩි වශයෙන් සසඳයි.<br>■ අභිමත ඒකක භාවිතයෙන් බඳුන්වල ධාරිතාව මැන සසඳයි. | ■ අභිමත ඒකකවලින් ද්‍රව මැනීම සහ සැසඳීම. | පාඩම 16 ක්‍රියාකාරකම 1 සිට 4 | 52 සිට 54 | පැය 2 |
| | ■ විවිධ ක්‍රියාකාරකම්හි නිරත වීමෙන් කාලය ගතවීම හඳුනා ගනියි. | ■ යම් සිද්ධියක් සඳහා කාලය ගතවන බව පිළිගනියි.<br>■ යම් ක්‍රියාකාරකමක් සඳහා එක් එක් අයට ගත වන කාලය වෙනස් වන බව ප්‍රකාශ කරයි.<br>■ එක ම සිද්ධියක් සඳහා විවිධ ක්‍රම යෙදීමේ දී ගත වන කාලය වෙනස් වන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ■ කාලය ගතවීම හඳුනා ගැනීම. | පාඩම 17 ක්‍රියාකාරකම 1 සිට 3 | 55 සිට 57 | පැය 01 මි.30 |

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | ▪ විවිධ වස්තුවල බර සසඳයි. | ▪ අතට දැනෙන පරිදි වස්තු දෙකක බර දෙඅත්ලේ තබා සසඳයි.<br><br>▪ තරාදියක් භාවිතයෙන් එක ම වර්ගයේ ද්‍රව්‍ය දෙකක් බර අඩු බර වැඩි වශයෙන් සසඳයි.<br><br>▪ තරාදියක් භාවිතයෙන් විවිධ ද්‍රව්‍යවල බර සසඳයි.<br><br>▪ තරමෙන් කුඩා බර වැඩි තරම වෙනස් නමුත් බර සමාන ද්‍රව්‍යවල බර තරාදිය භාවිතයෙන් සසඳයි. | ▪ බර සැසඳීම<br>▪ තරාදිය භාවිතය | පාඩම 18 ක්‍රියාකාරකම 1 සිට 3 | 58 සහ 59 | පැය 2 |
| දෙන ලද දිගක් අභිමත ඒකකයකින් නිවැරදි ව මැන ආසන්න අගය ප්‍රකාශ කරයි.<br><br>එක ම වර්ගයේ ද්‍රව්‍ය දිග අනුව පටිපාටිගත කරයි. | ▪ දිග/උස මැන සසඳයි. පටිපාටිගත කරයි. | ▪ සුදුසු අභිමත ඒකකයක් යොදාගෙන දිග/උස මනියි.<br><br>▪ සුදුසු අභිමත ඒකකයකින් දිග ප්‍රමාණ දෙකක් මැන දිග සසඳයි.<br><br>▪ වස්තු තුනක දිග/උස අභිමත ඒකකයකින් මැන සසඳයි. දිග අනුව පටිපාටිගත කරයි. | ▪ අභිමත ඒකකවලින් දිග මැනීම<br>▪ සැසඳීම<br>▪ පටිපාටිගත කිරීම | පාඩම 19 ක්‍රියාකාරකම 1 සිට 3 | 60 සිට 62 | පැය 2 |

දෙවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | ■ ජ්‍යාමිතික හැඩවල ලක්ෂණ විස්තර කරයි. | ■ ඉදිරිපත් කරන රූපයක ඇති ජ්‍යාමිතික හැඩ ගණන වෙන් වෙන් වශයෙන් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>■ වෘත්තය, ත්‍රිකෝණය, සෘජුකෝණාස්‍රය සහ සමචතුරස්‍රය යන ජ්‍යාමිතික හැඩවල සරල ගුණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ■ වෘත්තය, ත්‍රිකෝණය, සෘජුකෝණාස්‍රය සහ සමචතුරස්‍රය | පාඩම 20 ක්‍රියාකාරකම 1 සහ 3 | 64 සහ 67 | පැය 2 |
| | ■ අල්ලන ද්‍රව ප්‍රමාණය අනුව බඳුන්වල ධාරිතාව සසඳයි. පටිපාටිගත කරයි. | ■ අභිමත ඒකකයකින් මැන බඳුන් දෙකක ධාරිතාව (අල්ලන ප්‍රමාණය) සසඳයි.<br>■ භාජන තුනක්, අල්ලන ද්‍රව ප්‍රමාණය අනුව පටිපාටිගත කරයි. | ■ අභිමත ඒකකවලින් ද්‍රව මැනීම සහ සැසඳීම. | පාඩම 21 ක්‍රියාකාරකම 1 සහ 3 | 68 සිට 70 | පැය 2 මි.30 |

දෙවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | ■ අභිමත ඒකක භාවිතයෙන් බර මනියි. සසඳයි. | ■ අභිමත ඒකක භාවිතයෙන් වස්තු දෙකක බර මැන සසඳයි.<br>■ වස්තු තුනක බර මැන සසඳයි. පටිපාටිගත කරයි. | ■ බර සැසඳීම<br>■ පටිපාටිගත කිරීම | පාඩම 18 ක්‍රියාකාරකම 1 සහ 2 | 71 සහ 73 | පැය 02 |
| 1 සිට 50 තෙක් ඕනෑම සංඛ්‍යාවක් කියවයි. | ■ 50 තෙක් සංඛ්‍යා කියවයි, ලියයි. | ■ 1 සිට 50 තෙක් සංඛ්‍යා කියවයි.<br>■ 1 සිට 50 තෙක් සංඛ්‍යාංක හා සංඛ්‍යා නාම නිවැරදි ව ලියයි. | ■ 1 සිට 50 තෙක් සංඛ්‍යා | පාඩම 23 ක්‍රියාකාරකම 1 සිට 3 | 74 සිට 76 | පැය 02 |
| | | | | | මුළු පැය ගණන | පැය 24 |

## පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
## දෙවන ශ්‍රේණිය (දෙවන වාරය)

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ දෙවන ශ්‍රේණියට අදාළ අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගතය මෙහි දක්වා ඇත. ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී පරිසර ගවේෂණය, විද්‍යාත්මක සංකල්ප භාවිතය සිසුන් සමග සිදු කළ යුතු අතර මෙහි සඳහන් අනෙකුත් ඉගෙනුම් පලවලට අදාළ ක්‍රියාකාරකම් විශේෂයෙන් සෞන්දර්ය, ක්‍රීඩා හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් නිවෙස පාදක ව සිදු කිරීමට ද සිසුන් යොමු කළ යුතු ය. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වලට අදාළ කවි, ගීත ආදියෙහි අර්ථය ගායනයට පෙර සිසුන්ට පැහැදිලි කරමින් ඊට අදාළ ප්‍රකාශනාත්මක චලන ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

චිත්‍ර ඇඳීමේ දී, ඇඹීමේ දී, ආකෘති ගොඩනැගීමේ දී සිසුන්ගේ ඇති දක්ෂතාවලින් ම සිය නිර්මාණ එළිදැක්වීමටත් ඒවා අගය කරමින් ඔවුන්ගේ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය කිරීමටත් උත්සුක විය යුතු ය. නිවෙස් පාදක ව ක්‍රියාකාරකම් සිදු කරන සැම අවස්ථාවක දී ම සිසුන්ගේ හැකියා වර්ධනය වන පරිදි ඊට අදාළ ක්‍රියාකාරකම් ඔවුන් විසින් ම කිරීම සඳහා යොමු කළ යුතු ය. සිසු නිර්මාණ පාසලට පැමිණෙන දිනයන්හි රැගෙන ඒමට හා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා ගන්න. කණ්ඩායම් ලෙස හෝ තනි තනි ව ප්‍රදර්ශනය කිරීමටත් ඒවා අගය කිරීමටත් කටයුතු කරන්න.

සිසුන් තුළ යහපත් ආකල්ප ඉස්මතු වන ආකාරයට සැම ක්‍රියාකාරකමක් ම ගොඩනගා ගන්න. **ආදරය, කරුණාව, දයාව වැනි සංවර්ධනාත්මක චිත්තවේග දියුණු කිරීමටත්** කේන්තිය, හිංසාව, රිදවීම වැනි අහිතකර චිත්තවේග පාලනය කිරීමටත් සැම ක්‍රියාකාරකමකින් ම සමාජ හිතවාදී චර්යා ඉස්මතු කිරීමටත් වග බලා ගන්න.

**අන්මත ඉවසීම, අන් අයට ගරු කිරීම, නායකත්වයට ගරු කිරීම, සාමූහික ව කටයුතු කිරීම** ආදී සමාජ කුසලතා වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීමට කටයුතු කරන මෙන් තව දුරටත් ඉතා ආදරයෙන් ඉල්ලා සිටිමු.

මෙහි ඉදිරිපත් කර ඇති තේමා යටතේ ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි විෂයයට අදාළ ක්‍රියාකාරකම් සිදු කරන්න. එහි දී ගුරු මාර්ගෝපදේශයේ දෙන ලද උපදෙස් අනුව කටයුතු කරන්න. ගීතවලට සහ වචනවලට අදාළ ශ්‍රව්‍ය පට (Audio materials) www.nie.lk - Downloads - other materials - English - ABOE මගින් ලබා ගන්න.

## දෙවන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| පරිසරය ගවේෂණය කර තොරතුරු අනාවරණය කරගෙන ප්‍රකාශ කරයි.<br><br>කාර්යයක් ආරම්භ කර අවසානය දක්වා පවත්වාගෙන යයි | 06 අපට පෙනෙන අහස | ▪ අහස හා අවට පරිසරයේ සිදු වන වෙනස්කම් නිරීක්ෂණය කර වාර්තා කරයි.<br><br>▪ හිරු එළියෙන්, සුළඟින්, වර්ෂාවෙන් සිදුවන බලපෑම පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි<br><br>▪ විවිධ මාධ්‍ය භාවිත කරමින් අහස හා පාරිසරික වෙනසක්ම් විදහා දැක්වෙන නිර්මාණ කරයි<br><br>▪ අහසේ සුන්දරත්වය ප්‍රකාශනාත්මක මාධ්‍ය ඇසුරෙන් ඉදිරිපත් කර වින්දනයක් ලබයි. | ▪ දවසේ විවිධ අවස්ථාවල දී අහසේ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි.<br><br>▪ අධික හිරු රැසින් ශරීරයට සිදුවන හානිවලින් ශරීරය ආරක්ෂා කර ගැනීමට කටයුතු කරයි.<br><br>▪ හිරු එළියෙන් සිදුවන බලපෑම පිළිබඳ අත්දැකීම් විස්තර කරයි.<br><br>▪ විවිධ මාධ්‍ය භාවිත කරමින් ආකාශ වස්තු නිර්මාණය කරයි.<br><br>▪ විවිධ මාධ්‍ය භාවිත කරමින් ඇස්වල ආරක්ෂාව සඳහා යොදාගතහැකි නිර්මාණවල නියැලෙයි. | 01<br><br>02<br><br>04<br><br>05<br><br>06 | 131 සිට 135 | පැය 05 |

## දෙවන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| සෞඛ්‍යවත් ආහාර තෝරා ගැනීමේ පුරුදු ප්‍රදර්ශනය කරයි.<br><br>පෞද්ගලික පිරිසිදුකම හා පිළිවෙල පිළිබඳ සැලකිලිමත් ව කටයුතු කරයි.<br><br>ආහාර ගැනීමේ හොඳ පුරුදු ප්‍රදර්ශනය කරයි. තමා සිටින ස්ථානයේ පිරිසිදුකම හා පිළිවෙළ පිළිබඳ සැලකිලිමත් ව කටයුතු කරයි. | 07 අප කනබොන දේ | ■ ආහාර වර්ගවල ඇති වැදගත්කම හඳුනාගෙන නිමිත් පරිභෝජනය කරයි.<br><br>■ නිරෝගී පැවැත්මක් සඳහා නිවැරදි සෞඛ්‍ය පුරුදු පවත්වා ගනියි.<br><br>■ විවිධ මාධ්‍ය භාවිතයෙන් ආහාර හා සම්බන්ධ නිර්මාණවල යෙදේ.<br><br>■ ශක්ති වර්ධවයට උපකාරී වන චාලක ක්‍රියාකාරකම් යෙදේ. | ■ එදිනෙදා තම ආහාර වේල සඳහා ගන්නා පළා වර්ග රුචියෙන් පරිභෝජනය කරයි.<br><br>■ එදිනෙදා පරිභෝජනය සඳහා පෝෂ්‍යදායී ආහාර එක් කර ගැනීමට ක්‍රියා කරයි<br><br>■ රෝගවලින් ආරක්ෂා වීම සඳහා යහපත් ආහාර පුරුදු පවත්වා ගනියි<br><br>■ ආහාර නාස්තිය වළක්වා ගැනීම දායක වෙයි<br><br>■ ශරීර ශක්තිය වර්ධනය කර ගැනීම සඳහා උපකාරීවන චලන ගවේෂණ ක්‍රියාකාරකම්වල යෙදේ.<br><br>■ ආහාර ගැන කියවෙන රබන් පද වාදනය කරයි | 01 සිට 07 සහ 09 | 136 - 141 | පැය 09 |

## දෙවන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| ද්‍රව්‍ය හා උපකරණ සැලකිලිමත් ව පරිහරණය කරයි. | 08<br>තොරතුරු ලැබෙන හැටි | ■ සන්නිවේදනයේ දී භාවිත කරන විවිධ මාධ්‍ය හඳුනාගෙන ඒවා නිවැරදි ව හසුරුවයි.<br><br>■ සන්නිවේදනය හා බැඳුණු තාක්ෂණික උපකරණ භාවිතය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br><br>■ සන්නිවේදනයේ දී ආචාරශීලී ව කටයුතු කරයි.<br><br>■ විවිධ සංඥාවලට ප්‍රතිචාර දක්වමින් චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි. | ■ තොරතුරු නිවැරදිව ව ලබාග ැනීමේ හා ලබාදීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.<br><br>■ කටහඬ, අංගචලන සුදුසු පරිදි භාවීත කරමින් අදහස් හා හැඟීම් නිවැරදි ව ප්‍රකාශ කරයි.<br><br>■ තොරතුරු ලබාගැනීමට හා ලබා දීමට යොදාගන්නා විවිධ තාක්ෂණික භාණ්ඩ නිවැරදි ව හා ආරක්ෂාකාරී ව භාවිත කරයි.<br><br>■ තොරතුරු ලබා ගැනීමේ හා ලබාදීමේ දී ආචාරශීලී ව කටයුතු කරයි.<br><br>■ සංඥාවලට අනුව ප්‍රතිචාර දක්වමින් චාලක ක්‍රියාකාරකම්වල නියැළෙයි. | 01<br><br>02<br><br>03<br><br>05<br><br>07 | 142-145 | පැය 06 |

දෙවන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| පරිසරය ගවේෂණය කර තොරතුරු අනාවරණය කරගෙන ප්‍රකාශ කරයි.<br><br>කාර්යයක් ආරම්භ කර අවසානය දක්වා පවත්වාගෙන යයි | 09 වටපිටාවේ සිදුවන වෙනස්කම් | ■ පරිසරයේ සිදුවන වෙනස්කම් සහ ඒවාට සතුන් දක්වන ප්‍රතිචාර ගවේෂණය කර වාර්තා කරයි.<br><br>■ ආසන්න පරිසරයේ අහිතකර වෙනස්කම් හිතකර බවට පත් කර ගනියි.<br><br>■ ස්වාභාවික පරිසරයේ ඇති විය හැකි හදිසි තත්ත්වයන් පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි<br><br>■ වටපිටාවේ වෙනස්කම් සමඟ ක්‍රියා කරවිය හැකි නිර්මාණ කරයි.<br><br>■ අවකාශය භාවිත කරමින් වින්දනාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි. | වැස්ස, සුළඟ නිසා පරිසරයේ සිදු වන වෙනස්කම් කිහිපයක් නිරීක්ෂණය කර වාර්තා කරයි.<br><br>සුළඟ අධාරයෙන් ක්‍රියා කරවිය හැකි උපකරණ නිර්මාණ කර භාවිත කරයි.<br><br>සුළඟේ අධාරයෙන් නාද නිපදවිය හැකි උපකරණ නිර්මාණය කර භාවිත කරයි. | 01 සිට 03<br>05 සහ 06<br>08 සහ 09 | 147 -151 | පැය 06 |

දෙවන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| තමා සිටින ස්ථානයේ පිරිසිදුකම හා පිළිවෙළ පිළිබඳ සැලකිලිමත් ව කටයුතු කරයි.<br><br>ද්‍රව්‍ය හා උපකරණ සැලකිලිමත් ව පරිහරණය කරයි.<br><br>පාසල් පරිසරය තුළ ආචාරශීලී ව කටයුතු කරයි. | 10 අපේ යහපැවැත්ම | ■ මනා සංවිධානයකින් යුතු ව කටයුතු කිරීමෙන් තම කාර්ය සාර්ථක ව සිදු කර ගනියි.<br><br>■ යහගුණ අගය කරමින් එම ගුණාංග පවත්වාගෙන යෑමට කටයුතු කරයි.<br><br>■ වගකීම් ඉටු කරමින් පොදු කටයුතු සඳහා දායකත්වය ලබා දෙයි.<br><br>■ යහපැවැත්මට අදාළ නීතිරීති පිළිග නිමින් නීතිගරුක ව හැසිරෙයි.<br><br>■ ශාරීරික සහ මානසික යෝග්‍යතාව පවත්වා ගැනීමට ඉවහල් වන ක්‍රියාකාරකම්වල නිරත වෙයි.<br><br>■ වින්දනාත්මක ප්‍රවේශ භාවිත කරමින් යහපත් චර්යා පිළිබිඹු කරයි. | ■ පාසලේ දී තම එදිනෙදා කටයුතු පිළිවෙළකට සහ ක්‍රමවත් ව පවත්වාගනියි.<br><br>■ පන්ති කාමරයේ/ පාසලේ දී පැවරෙන කාර්යන් සාමූහික ව ඉටු කිරීමට දායක වෙයි.<br><br>■ පාසලේ කටයුතුවල දී යහපත් හැසිරීම් ප්‍රදර්ශනය කරයි.<br><br>■ පන්ති කාමර ක්‍රියාකාරකම්වල නියැළීමේ දී තමාගේ වාරය ලැබෙන තෙක් සිටියි<br><br>■ පාසලේ පොදු නීතිරීතිවලට අනුගත ව ක්‍රියා කරයි.<br><br>■ යහපුරුදු අවධාරණය කෙරෙන කවි,පී රැස්කර ගායනා කරයි. | 01-05 | 152 -155 | පැය 06 |

දෙවන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| පරිසරය ගවේෂණය කර තොරතුරු අනාවරණය කරගෙන ප්‍රකාශ කරයි.<br><br>සරල මැහුම් ක්‍රමයක් භාවිත කර රෙදි කැබලි දෙකක් මූට්ටු කරයි. | 11 අපට ඕනෑ දේ ලැබෙන හැටි | ■ අවශ්‍ය අවස්ථාවල දී අපට උදවු ලබාදෙන අය හඳුනාගෙන ඔවුන් කෙරෙහි යහපත් ආකල්පයකින් යුතු ව කටයුතු කරයි.<br><br>■ වෙළඳසැලක ස්වභාවය හා ක්‍රියාකාරීත්වය හඳුනාගෙන වාර්තා කරයි.<br><br>■ තමාට ලැබුණ දේ අන්‍යයන් සමඟ බෙදාහදා ගැනීමේ හැකියාව පවත්වා ගනියි.<br><br>■ අපට අවශ්‍ය දේ අපට ම නිෂ්පාදනය කරගත හැකි බව අවබෝධ කර ගනිමින් කටයුතු කරයි<br><br>■ එදිනෙදා අවශ්‍ය දෑ විවිධ ද්‍රව්‍ය ඇසුරෙන් නිර්මාණය කරයි. | ■ එදිනෙදා අපගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට උදවු ලබා දෙන අය කෙරෙහි යහපත් අයුරින් කටයුතු කරයි.<br><br>■ වෙළෙඳ පොළක දී අප කටයුතු කළ යුතු අයුරු හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br><br>■ පන්ති කාමර කටයුතුවල දී ගතයුතු දේ අන්අය සමඟ බෙදාහදා ගැනීමේ පුරුද්ද ප්‍රදර්ශනය කරයි.<br><br>■ එදිනෙදා අවශ්‍යවන සමහර දේ තමා විසින්ම සකස් කරගනියි.<br>■<br>■ මැහුම් සම්බන්ධ මූලික හුරුකම් ලබයි. | 01- 03<br><br>05 | 157-160 | පැය 07 |
| | | | | | මුළු පැය ගණන | පැය 39 |

| නිපුණතාව | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම් | ගුරු මාර්ගෝපදේශයේ සඳහන් පිටු අංකය | කාලය (පැය) |
|---|---|---|---|---|
| මිතුරන් සමඟ පවුලේ තොරතුරු හුවමාරු කර ගනියි | **உங்கள் அம்மா பெயர் என்ன?**<br>උංගල් අම්මා පෙයර් එන්න?<br>(ඔයාගේ අම්මාගේ නම මොකක් ද?)<br><br>**எனது அம்மா பெயர் ...........**<br>එනදු අම්මා පෙයර්.......<br>(මගේ අම්මාගේ නම ..............)<br><br>**உங்கள் அப்பா பெயர் என்ன?**<br>උංගල් අප්පා පෙයර් එන්න?<br>(ඔයාගේ තාත්තාගේ නම මොකක් ද ?<br><br>**எனது அப்பா பெயர் ............**<br>එනදු අප්පා පෙයර්.......<br>(මගේ තාත්තාගේ නම ..............)<br><br>**உங்கள் அண்ணா பெயர் என்ன?**<br>උංගල් අණ්ණා පෙයර් එන්න?<br>(ඔයාගේ අයියාගේ නම මොකක් ද ?<br><br>**எனது அண்ணா பெயர் ............**<br>එනදු අණ්ණා පෙයර්.......<br>(මගේ අයියාගේ නම ..............) | 1-2 | 213 | පැය 2 |

| නිපුණතාව | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම් | ගුරු මාර්ගෝපදේශයේ සඳහන් පිටු අංකය | කාලය (පැය) |
|---|---|---|---|---|
| | **உங்கள் அக்கா பெயர் என்ன?**<br>උංගළ් අක්කා පෙයර් එන්න?<br>(ඔයාගේ අක්කාගේ නම මොකක් ද ?<br><br>**எனது அக்கா பெயர் ............**<br>එනදු අක්කා පෙයර්.......<br>(මගේ අක්කාගේ නම ..............)<br><br>**உங்கள் தங்கை பெயர் என்ன?**<br>උංගළ් තංගෛ පෙයර් එන්න?<br>(ඔයාගේ නංගිගේ නම මොකක් ද ?<br><br>**எனது தங்கை பெயர் ............**<br>එනදු තංගෛ පෙයර්.......<br>(මගේ නංගිගේ නම ..............)<br><br>**உங்கள் தம்பி பெயர் என்ன?**<br>උංගළ් තම්බි පෙයර් එන්න?<br>(ඔයාගේ මල්ලිගේ නම මොකක් ද ?<br><br>**எனது தம்பி பெயர் ...........**<br>එනදු තම්බි පෙයර්.......<br>(මගේ මල්ලිගේ නම ..............)<br><br>**எனக்கு அக்கா இல்லை.**<br>එනක්කු අක්කා ඉල්ලෛ<br>(මට අක්කා කෙනෙක් නැහැ) | | | |

## දෙවන ශ්‍රේණිය - දෙවන ජාතික භාෂාව

| නිපුණතාව | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම් | ගුරු මාර්ගෝපදේශයේ සඳහන් පිටු අංකය | කාලය (පැය) |
|---|---|---|---|---|
| 1 - 10 තෙක් සංඛ්‍යා අවබෝධයෙන් යුතු ව භාවිත කරයි | **ஒன்று** ඔන්රු (එක)<br>**இரண்டு** ඉරණ්ඩු (දෙක)<br>**மூன்று** මූන්රු (තුන)<br>**நான்கு** නාන්ගු (හතර)<br>**ஐந்து** ඓන්දු (පහ)<br>**ஆறு** ආරු (හය)<br>**ஏழு** ඒළු (හත)<br>**எட்டு** එට්ටු (අට)<br>**ஒன்பது** ඔන්බදු (නවය)<br>**பத்து** පත්තු (දහය) | 1-6 | 214 - 216 | පැය 1 |
| පාට නම් කරමින් සරල වැකි කියයි | **வானம் நீல நிறம்.**<br>වානම් නීල නිරම් (අහස නිල් පාට යි)<br><br>**இலை பச்சை நிறம்.**<br>ඉලෙ පච්චෙ නිරම් (කොළය කොල පාට යි)<br><br>**வாழைப்பழம் மஞ்சள் நிறம்.**<br>වාළෛප්පළම් මඤ්ජල් නිරම් (කෙසෙල් කහ පාට යි)<br><br>**கொக்கு வெள்ளை நிறம்.**<br>කොක්කු වෙල්ළෛ නිරම් (කොකා සුදු පාට යි<br><br>**காகம் கறுப்பு நிறம்.**<br>කාහම් කරුප්පු නිරම් (කපුටා කළු පාට යි)<br><br>**ஜம்பு சிவப்பு நிறம்.**<br>ජම්බු සිවප්පු නිරම් (ජම්බු රතු පාට යි) | 1 - 2 | 217 | පැය 1 |

## දෙවන ශ්‍රේණිය - දෙවන ජාතික භාෂාව

| නිපුණතාව | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම් | ගුරු මාර්ගෝපදේශයේ සඳහන් පිටු අංකය | කාලය (පැය) |
|---|---|---|---|---|
| අන්‍යෝන්‍ය සහයෝගීතාව වර්ධනය සඳහා සුහද කතාබහේ යෙදෙයි | **எப்படி சுகம்?**<br>එප්පඩි සුහම් ?<br>(සැප දුක් කොහොම ද ?)<br><br>**நல்ல சுகம்**<br>නල්ල සුහම්<br>(සුවෙන් සිටිනවා) | 1-3 | 218 - 219 | පැය 1 |
| | | | මුළු කාලය | පැය 05 |

**සැ.යු.**

සියලු ආගම් විෂයයන්ට අදාළ විෂය අන්තර්ගත ක්‍රියාත්මක කිරීම සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති කාලයම සුදුසු පරිදි සැලසුම් කර ගැනීමට යෝජිත ය.